# මයින පැටවුන්ගේ දොරට වැඩුම



නිර්මාණය - සශේලි හෙට්ටිආරච්චි

# මයින පැටවුන්ගේ දොරට වැඩුම

සශේලි හෙට්ටිආරච්චි

2023.11.15

ISBN No : ISBN 978-624-206-975-3

9 786242 069753

# පිදුම

මාගේ කුළුදුල් උත්සාහයට අත්පොත් තැබූ
පන්තිභාර ගුරුතුමිය වන ජී.එච්. සමන්මලී කුමාරි
ගුරුමෑණියන්ට, දෙමව්පියන්ට, අත්තම්මා සහ අත්තාට
ආදරයෙන් තිළිණ කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේම නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සාමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙයින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.11.01



"අද නම් ලස්සන දවසක් නේද හාමිනේ? අපි අද ගෙයක් හදන්න තැනක් බලමු නේද? " මයිනහාමි අහස දිහා බලමින් කීවා.

"හ්ම්, ඒක නම් හොඳ අදහස" මයිනහාමිනෙත් උත්තර දුන්නා.

"යමු, අපි බලමු. " මයිනහාමි ඉස්සර වුණා.

"හාමිනේ, අර ගෙදර නම් කූඩුවකට සුදුසු තැනක් තියෙනවා. තැන නම් හොඳයි වගේ. අපි තව ටිකක් විපරම් කරමුද? " මයිනහාමි තමාගේ අදහස කීවා.

"මයිනහාමි, ඒ ගෙදර චූටි ළමයි දෙන්නෙක් ඉන්නවා. ඒ ළමයි නම් ගහ කොළේට සතා සීපාවට ආදරෙයි වගේ. අපට හොඳ ආරක්ෂාවක් තියේවි එතැන."

"හරි මම තවත් බලන්නම්කෝ ඒ ගැන. " මයිනහාමි කීවා.



"හාමිනේ ඇත්තම තමා. හාමිනේ කීවා වගේ එතැන හොදයි. අපි කූඩුව හදමු. පුතාලට හොඳ ඇඳක් ඕනනේ. අපි බඩු ටික ගෙනෙමු නේද? "



"දෙදෙනාම වටපිටාවේ ඇවිද පුළුන්, කොළ, කොහු , පිහාටු ආදිය එකතු කළා. ටික දිනකින් ලස්සන සුව පහසු ඇඳක් හදා ගත්තා. ටික දවසකදී මයිනහාමි බිත්තර දෙකක්ම දැම්මා "



ටික දිනක් ගත වුණා. හාමිනේ හැම වෙලේම බිත්තර වලට උණුසුම දුන්නා.

ටික දවසකදී "කීචි චීචි " හඬ ඇසුණා.

"හාමිනේ, ඔයා ඔතනම ඉන්න. මම කෑම හොයාගෙන එන්නම්. " කී මයිනහාමි ගෙදරින් පිටත් වුණා. මයිනහාමිනේ පැටවු බලාගෙන ඉන්නවා. තව වේලාවකදී මයිනහාමි කූඩුවේ ඉදලා මයිනහාමිනේ කෑම හොයා ගෙන එනවා.



ටිකෙන් ටික පැටවු ලොකු වෙනවා. මයිනහාමිටයි මයිනහාමිනේටයි හරි සතුටුයි.

"හාමිනේ, අපේ පුතාලා හරි දඟයි නේද?"

"ඒක තමා," හාමිනෙත් එය අනුමත කළා. "මම කෑම ටිකක් හොයා ගෙන එන්නම්. ඔයා ඉන්න." කී මයිනහාමි කෑම හොයා ගෙන එන්න ගියා.

එක පාරටම ලේන් හාමිලයි, දෙමලිච් යාළුවොයි කෑ ගහන්න පටන් ගත්තා. මයිනහාමි වටපිට බැලුවා.



"අනේ දෙයියනේ!, මොකද කරන්නේ ගැරඬිහාමි එන්නේ අපේ කූඩුවට නේද? අනේ! අපිව බේරලා දෙන්න." මයිනහාමිනෙත් ඇති වීරියෙන් කෑ ගැහුවා. මයිනහාමිටත් ඒ හඬ ඇහුණා.ඉක්මනින් පියඹා ගෙන ආවා. "අනේ අපිව බේරලා දෙන්න." දෙන්නාම කෑ ගැහුවා.



ඒ ගෙදර චූටි ළමයි දෙන්නට ඒ හඬ ඇහුණා. ඔවුන් දුවගෙන ආවා. වටපිට බැලුවා. ගැරඬිහාමි හෙමින් හෙමින් මිදි වැල දිගේ මයින කූඩුව දෙසට ඇදෙනවා දැක්කා. "අත්තේ, අත්තේ අපේ මයින කූඩුවට ගැරඬියෙක් එනවා. අනේ චූටි පැටවු කයි. එයාලව බේරගමු." ඔවුනුත් කෑ ගැහුවා.



අත්තා දිග ලීයකින් තට්ටු කළා. ගැරඬිහාමි හොඳටම බය වුණා. හෙමින් වෙනත් පැත්තකට යන්න ගියා. "අම්මෝ! ඇති යාන්තම්. අර බබාලට පිං සිද්ධ වෙන්න, අපේ පුතාලා බේරුණා." කියමින් මයින හාමිනේ ඇඬුවා.

"අඬන්න එපා හාමිනේ. දැන් හරිනේ ඒකනේ මං කිව්වේ මෙතන හොඳයි කියලා." කූඩුව හදන්න මයිනහාමි සැනසුම් සුසුම් හෙළුවා.

මෙහෙම ටික දිනක් ගතවුණා. මයිනහාමි මයිනහාමිනේට කතා කළා. "හාමිනේ, අද හොඳට ඉරත් පායලා හොඳ දවසක්. අද අපි අපේ පුතාලාගේ දොරට වැඩුම කළොත් හොඳයි නේද? අපි යාළුවන්ටත් කියමු." උදෑසනම මයිනහාමි යාළුවන්ට ආරාධනා කළා.



හොඳයි හොඳයි මේ දැන්ම අපි එනවා. සැවොම එකතු වුණා. දෙමලිච්චන්ගේ ප්‍රීති ඝෝෂා අතරේ ලේන් හාමිනේගේ ටිංටිං සංගීතයක් එක්ක, පරිසරයම සුන්දරයි, හරිම අපූරුයි. මයිනහාමිත් මයිනහාමිනෙත් එහෙට දුවනවා, මෙහෙට දුවනවා. චූටි පැටවු පොඩ්ඩක් එළියට ආවා. අඩියක් දෙකක් තිබ්බා.



පුතා බයවෙන්න එපා. එන්න අපි බලන් ඉන්නවානේ. මයිනහාමිනේ ඉස්සර වුණා. ලොකු පැටියා ළඟ තියෙන ගහේ, අත්තකට පැන ගත්තා. තාත්තාට හරි සතුටුයි. සතුටින් කෑ ගහනවා. "හරි පුතා එන්න, මගේ පුතා හරි හපනා." ඔන්න දෙන්නම ටික ටික ඈතට පියෑඹුවා. මයිනහාමිටයි, මයින හාමිනේටයි අද හරිම සතුටුයි. ආඩම්බරයි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 .11 .01